# අත්තනගල්ල ප්‍රාදේශීය සභාව.

# ගම්පහ දිස්ත්‍රික්කය

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2011 මාර්තු 30 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2010 මාර්තු 23 දිනද විගණනයට ඉදිරිපත් කර තිබුණ.

1.2 **මතය**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව අත්තනගල්ල ප්‍රාදේශීය සභාවේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට අත්තනගල්ල ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත්, මා දරන්නා වූ මතය වේ.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

1.3.1 **ගිණුම්කරණ අඩුපාඩු**

(අ) 2010 මාර්තු සිට ජුනි දක්වා වූ කාලයට අදාල දේපළ ණය පොළී ප්‍රතිපූර්ණ රු.91,658 ක මුද්දර ආදයම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළදී අවස්ථා දෙකකදී ලැබී තිබූ දළ මුද්දර ආදායම් ගිණුම්ගත කර තිබුණද, ඊළඟ අවස්ථා දෙකේදී ලැබී තිබූ මුද්දර ආදායම් වලින් කාර්ය මණ්ඩලය සඳහා වූ දිරි දීමනා අඩු කර ගිණුම් ගත කිරීම නිසා මුද්දර ආදායම හා 1-1-01-(9) I වැය ශීර්ෂයෙහි වියදම රු.73,793 ක් අඩුවෙන් ගිණුමේ දැක්විණි.

(ඇ) ඉකුත් වර්ෂයේ ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම් සඳහා වියදම් කර තිබූ රු.2,404,177 ක් හා සමාලෝචිත වර්ෂයේ කර තිබූ ඉදි කිරීම් සඳහා වියදම් කර තිබූ රු.544,032 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ඈ) ඉකුත් වර්ෂයේ විගණකාධිපති වාර්තාවේ 2.2.1(උ) ඡේදය අනුව, ගිණුම් ගතවී නොතිබූ වටිනාකම රු.5,467,822 ක්වූ ඉඩම් හා ගොඩනැගිලි සමාලෝචිත

වර්ෂය තුළදීද ගිණුම් ගත කර නොතිබූ අතර, ඉකුත් වාර්තාවේ 2.2.1 (ජ) ඡේදය අනුව නිරීක්ෂණය කර තිබූ ස්ථාවර වත්කම් ලේඛන සහ ගිණුම සමඟ ඉදිරිපත් කර තිබූ උපලේඛන අතර රු.1,475,939 ක වෙනස සසඳා බලා නිවැරදි කර නොතිබුණි.

1.3.2 **නොසැසඳූ පාලන ගිණුම්**

ගිණුම් විෂයයන් 09 කට අදාලව පාලන ගිණුම් අනුව ශේෂයන්ගේ එකතුව රු.69,375,546 ක් වූ අතර, ඒවාට අදාල උපයෝගී ලේඛන/ වාර්තා අනුව ගිණුම් ශේෂයන්ගේ එකතුව රු.59,172,601 ක් විය.

1.3.3 **ගෙවිය යුතු ගිණුම්**

2010 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.11,085,599 ක් විය.

1.3.4 **විගණනය සඳහා සාක්ෂි නොවීම**

**තොරතුරු ඉදිරිපත් නොකිරීම**

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.18,454 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

1.3.5 **නීති,රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම්**

පහත දැක්වෙන නීති, රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| **නීති, රීති හා රෙගුලාසි වලට යොමුව** | **අනුකූල නොවීම** |
| --- | --- |
| 1988 ප්‍රාදේශීය සභා (මුල්‍ය හා පරිපාලන) රීති මාලාව | |
| (i) 59 හා 60 රීති | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150(1) වගන්තිය ප්‍රකාර සභා බල ප්‍රදේශය තුළ කර්මාන්ත පිළිබඳ සමීක්ෂණයක් පවත්වා 60 වගන්තියේ දක්වා ඇති තොරතුරු ඇතුළත් ලැයිස්තුවක් සෑම වර්ෂයකම මාර්තු 31 දිනට පෙර ආදායම් පරිපාලක හෝ ආදායම් පරීක්ෂක විසින් ලේකම්වරයා වෙත ඉදිරිපත් කළයුතු වුවත්, එපරිදි කටයුතු කර නොතිබුණි. |

| | |
|---|---|
| (ii) 178 (3) රීතිය | අනුමත සමිති පිළිබඳ යාවත්කාලීන ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (iii) 217 රීතිය | සභාව සතු සියළුම ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳ විස්තර පී.එස්.46 ආකෘතිය ප්‍රකාර ලේඛනයක පවත්වා ගත යුතු වුවත්, ඊට අනුරූපී නොවූ ලේඛනයක විස්තර ඇතුළත් කර තිබුණි. |

2. <u>මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය</u>

2.1 <u>මූල්‍ය ප්‍රතිඵලය</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.7,743,431 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.28,236,608 ක් විය.

2.2 <u>මූල්‍ය පාලනය</u>

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) <u>බැංකුවට වෙනත් හර කිරීම්</u>

2003 සැප්තැම්බර් මාසයේදී බැංකුව හර කර තිබූ රු.11,790 ක මුදල සම්බන්ධයෙන් තොරතුරු ලබා ගෙන එය ගිණුම්ගත කිරීමට හෝ නිරවුල් කර ගැනීමට කටයුතු නොකර දිගින් දිගටම බැංකු සැසඳුම් ප්‍රකාශයේ දක්වා තිබුණි.

(ආ) 2010 දෙසැම්බර් 31 දිනට එගොඩපොත, වේයන්ගොඩ, බෙම්මුල්ල, ඔයබඩපේරුව හා මෙගොඩපොත උප කාර්යාලවල රැස්කිරීමේ ගිණුම්වල මාස 5 ක පමණ කාලයක් තිස්සේ රු.4,928,817 ක මුදලක් එකතුවී තබුණි.
රැස්කිරීමේ ගිණුම්වල එකතුවන මුදල් වලට බැංකුව පොලියක් ගෙවනු නොලබන බැවින් නොපමාව එම මුදල් සභාවේ ගිණුමකට මාරුකර ගැනීමට කටයුතු කළ යුතුව තිබුණද එසේ කර නොතිබුණි.

(ඇ) 1988 ප්‍රාදේශිය සභා (මූල්‍ය හා පරිපාලන) රීති සංග්‍රහයේ 29 වැනි වගන්තිය අනුව එකතු වන සම්පූර්ණ මුදල දිනපතාම බැංකුවෙහි තැන්පත් කළ යුතු වුවද, ඔයබඩපේරුව උප කාර්යාලයේ එදිනෙදා එකතු කෙරෙන මුදල් බැංකුගත කර නොතිබුණි.

2.3 **ආදායම් පරිපාලනය**

2.3.1 **ඇස්තමේන්තුගත, තථ්‍ය හා හිඟ ආදායම්**

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත, තථ්‍ය හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | 2010 | | | 2009 | | |
|---|---|---|---|---|---|---|---|
| | | ඇස්තමේ -න්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය | ඇස්තමේ -න්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
| | | රු. 000` | රු. 000` | රු. 000` | රු. 000` | රු. 000` | රු. 000` |
| (i) | වරිපනම් හා බදු | 39,846 | 15,205 | 24,586 | 36,575 | 10,769 | 25,806 |
| (ii) | බදු කුලී | 3,548 | 2,944 | 684 | 3,224 | 1,985 | 1,064 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,613 | 1,285 | 328 | 1,437 | 1,014 | 423 |
| (iv) | වෙනත් ආදායම් | 4,591 | 3,211 | - | 4,149 | 4,348 | - |

ඉහත තොරතුරු ගිණුමේ දැක්වෙන සංඛ්‍යා සමඟ නොසැසඳුන බව නිරීක්ෂණය විය.

2.3.2 **හිඟ වරිපනම් බදු**

2010 දෙසැම්බර් 31 දිනට රු.10,000 ට වැඩි, හිඟ කාල පරිච්ඡේදය අවු.1-20 ක් අතර හිඟ වරිපනම් බදු පිළිබඳ විස්තර පහත දැක්වේ.

| උප කාර්යාලය | වරිපනම් ඒකක ගණන | 2010 දෙසැම්බර් 31 දිනට හිඟ මුදල |
|---|---|---|
| | | රු. |
| එගොඩපොත | 09 | 892,719 |
| මෙගොඩපොත | 11 | 180,772 |
| ඔයබඩපේරුව | 04 | 241,074 |
| වේයන්ගොඩ | 41 | 911,904 |

දේපළ තහනම් කිරීමේ නිලධාරීන් දෙදෙනෙකු සහ ආදායම් නිලධාරීන් 04 දෙනෙකු සභාවේ සේවය කළද ඔවුන්ගේ සේවය ඵලදායිව යොදාගෙන 1987 අංක 15 දරන

ප්‍රාදේශීය සභා පනතේ 158 (1) වගන්තිය ප්‍රකාරව දේපළ තහනමට ගෙන හෝ හිඟ වරිපනම් අයකර ගැනීමට ලේකම් කටයුතු කර නොතිබුණි.

2.3.3 <u>හිඟහිටි වෙනත් ආදායම්</u>

සමාලෝචිත වර්ෂය සහ ආසන්නතම පසුගිය වර්ෂ තුනේ හිඟහිටි වෙනත් ආදායම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| වර්ෂය | හිඟහිටි වෙනත් ආදායම් |
|---|---|
| ---------- | ------------------ |
| | රු. |
| 2007 | 11,901,913 |
| 2008 | 13,212,830 |
| 2009 | 13,240,226 |
| 2010 | 13,432,819 |

ආදායම් එකතු කිරීමේ කාර්යයන් සඳහා ආදායම් පරිපාලකවරු 04 දෙනෙක් සේවයේ යෙදී සිටියද හිඟ ආදායම් අයකර ගැනීම දුර්වල තත්ත්වයක විය.

2.3.4 <u>කඩකුලී</u>

(i) 2010 දෙසැම්බර් 31 දිනට දීර්ඝ කාලයක සිට පවතින හිඟ හිටි කඩ කුලී රු.11,392,394 ක් වූ අතර, එම හිඟය අයකර ගැනීමට බදු ගිවිසුම අනුව කටයුතු කර නොතිබුණි. විගණිත දිනය වූ 2011 ජූලි 11 දින වන විටත් මෙම ස්ථාන වල ව්‍යාපාර කටයුතු කර ගෙන යමින් පැවතුණි.

(ii) රාජ්‍ය ආයතන වලට ලබාදී තිබූ ගොඩනැගිලි වලින් 2010 දෙසැම්බර් 31 දිනට රු.3,597,300 ක හිඟ මුදලක් අයවීමට තිබූ අතර, කඩ කුලී ගිවිසුම් නොමැති වීම නිසා නීත්‍යානුකුල පියවර ගැනීමේ බාධා පවතින බවක් නිරීක්ෂණය විය.

(iii) අත්තනගල්ල නව වෙළඳ සංකීර්ණයේ බිම් මහලේ කඩ කාමර 12 කින් 2010 දෙසැම්බර් 31 දිනට රු.353,225 ක හිඟ බදු මුදලක් අයවීමට තිබූ අතර, කඩ කාමර 04 ක කුලී ගිවිසුම් විගණනයට ඉදිරිපත් නොවීය.

2.4 **<u>වියදම් ව්‍යුහය</u>**

සමාලෝචිත වර්ෂය සහ ඉකත් වර්ෂය සඳහා සභාවේ අයවැයගත හා තථ්‍ය වියදම අදාල විචලනයන්ද සමඟ පහත දැක්වේ.

| | 2010 | | | 2009 | | |
|---|---|---|---|---|---|---|
| වියදම් විෂයය | අයවැයගත | තථ්‍ය | විචලනය | අයවැයගත | තථ්‍ය | විචලනය |
| | රු. 000` | රු. 000` | රු. 000` | රු. 000` | රු. 000` | රු. 000` |
| **<u>පුනරාවර්තන වියදම්</u>** | | | | | | |
| පෞද්ගලික පඩිනඩි | 68,536 | 55,707 | 12,829 | 52,727 | 54,068 | (1,341) |
| අනෙකුත් | 61,458 | 37,577 | 23,881 | 63,900 | 31,339 | 32,561 |
| උප එකතුව | 129,994 | 93,284 | 36,710 | 116,627 | 85,407 | 31,220 |
| ප්‍රාග්ධන වියදම | 45,201 | 56,956 | (11,755) | 17,877 | 85,352 | (67,475) |
| මුළු එකතුව | 175,195 | 150,240 | 24,955 | 134,504 | 170,759 | (36,255) |

2.5 **<u>මානව සම්පත් කළමනාකරණය</u>**

**<u>අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව</u>**

2010 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සහ තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| සේවක ශ්‍රේණිය | අනුමත | තථ්‍ය |
|---|---|---|
| මාණ්ඩලික | 03 | 03 |
| ද්විතියික | 64 | 55 |
| ප්‍රාථමික | 153 | 128 |
| වෙනත් (අනියම්, තාවකාලික/ආදේශක) | - | 30 |
| එකතුව | 220 | 216 |

2.6 **<u>වත්කම් කළමනාකරණය</u>**

2.6.1 **<u>ලැබිය යුතු ගිණුම්</u>**

2010 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු. 1,682,727 ක් වූ අතර, අවුරුදු 01 කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂයන්හි එකතුව රු.348,704 ක් විය.

2.6.2 **<u>අය නොවන සේවක ණය</u>**

2010 දෙසැම්බර් 31 දිනට සේවකයන් 37 දෙනෙකුගෙන් අයකර ගත යුතු හිඟ ශේෂය රු.256,974 ක් විය. මෙම ශේෂ 1990,1993, 2001 වැනි වර්ෂවල හා ඊට පෙර සිට පැවත එන ඒවා විය. මියයාම, වැඩතහනමට ලක්වීම, සේවය හැරයාම, විශ්‍රාම යාම වැනි හේතු මත අය නොවී පවතින සේවක ණය, මරණ පාරිතෝශිකය, විශ්‍රාම පාරිතෝශිකය හෝ ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට හැකියාව තිබී තිබුණද, සභාව ඒ පිළිබඳ නිසි අවධානය යොමු කර නොමැති වීම නිසා අඛණ්ඩව ඉදිරියට ගෙන එමින් පවතින බව නිරීක්ෂණය විය.

2.7 **<u>මෙහෙයුම් අකාර්යක්ෂමතා</u>**

2.7.1 **<u>වෙළඳ බලපත්‍ර නිකුත් කිරීම</u>**

(අ) සභා බල ප්‍රදේශය තුළ පවත්වා ගෙන යන විවිධ වෙළඳ ව්‍යාපාර සඳහා වෙළඳ බලපත්‍ර නිකුත් කිරීමේදී මහජන සෞඛ්‍ය පරීක්ෂකගේ හා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීගේ වාර්තා අනුව බලපත්‍ර නිකුත් කළ යුතු වුවද, එවැනි වාර්තා ලබා ගැනීමකින් තොරව බලපත්‍ර නිකුත් කර තිබූ බව නිරීක්ෂණය විය. මේ නිසා සෞඛ්‍ය ආරක්ෂිත නොවූ හෝ පරිසරයට හානිකර ව්‍යාපාර පාලනය කිරීම පිළිබඳ සභාව සතු වගකීම නිසියාකාරව ඉටු නොවීමේ අවදානමක් නිරීක්ෂණය විය.

(ආ) ව්‍යාපාරිකයන් වෙළඳ බලපත්‍රයක් ලබා ගැනීම සඳහා ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කර තිබුණද, හේතු දැක්වීමකින් තොරව වෙළඳ බලපත්‍රයක් නිකත් කර නොතිබූ අවස්ථා විගණනයේදී අනාවරණය විය.

2.7.2 **<u>තාවකාලික විශ්‍රාම වැටුප අය නොකිරීම</u>**

නිලධාරියෙකු වෙත 1995 ජනවාරි සිට 2002 දෙසැම්බර් දක්වා ගෙවා ඇති තාවකාලික විශ්‍රාම වැටුප් රු.38,893 ක් විශ්‍රාම පාරිතෝෂිකයෙන් අයකර ගැනීමට විගණිත දිනය තෙක් කටයුතු කර නොමැති බව නිරීක්ෂණය විය.

2.7.3 **<u>සේවක ඇප</u>**

2010 සැප්තැම්බර් 30 දින වන විට විශ්‍රාමගොස්, මියගොස් හා සේවය හැරගොස් තිබූ නිලධාරීන්ට/සේවකයන්ට ගෙවිය යුතු සේවක ඇප එකතුව රු.26,077ක් ආපසු ගෙවීමට කටයුතු කර නොතිබුණි.

2.7.4 <u>රඳවා ගැනීමේ බදු</u>

2001 වර්ෂයේදී දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත වැඩිපුර ගෙවා තිබූ රඳවා ගැනීමේ බදු රු.28,800 ක් ආපසු ගෙන්වා ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.8 <u>අභ්‍යන්තර විගණනය</u>

ආයතනය තුල ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

3. <u>පද්ධති හා පාලන</u>

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) වත්කම් කළමනාකරණය